# 2.3.1 - සෛල චක්‍රය හා සෛල විභාජන ක්‍රියාවලිය

<u>සෛල චක්‍රය</u>

- එක් සෛල විභාජනයක අවසානයේ සිට ඊලග සෛල විභාජනයේ අවසානය තෙක් සෛලයක සිදුවන සිදුවීම් අනුපිළිවෙල සෛල චක්‍රය ලෙස හඳුන්වයි.
- සෛල විභාජනය අවසානයේදී මාතෘ සෛලයට සමාන ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ සෛල 2ක් අනුනනය මගින් නිපදවේ.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

## - සෛල චක්‍රය-

- සුන්‍යෂ්ටික සෛල චක්‍රය ප්‍රධාන කලා 2ට වෙන් කළ හැකිය.
    - අන්තර් කලාව
    - අනුනන කලාව/M කලාව

**<u>අන්තර් කලාව</u>**

- සෛල චක්‍රයෙන් 90% පමණ ආවරණය කරයි.
- සෛල චක්‍රයේ දීර්ඝතම කලාවයි.
- කලා තුනකට වෙන් කල හැකිය.
    - $G_1$ කලාව (ප්‍රථම පරතර කලාව)
    - S කලාව (සංශ්ලේෂණ කලාව)
    - $G_2$ කලාව (දෙවන පරතර කලාව

<u>$G_1$ කලාව</u>

- ප්‍රෝටීන සංශ්ලේෂණය කරයි.
- සෛල වර්ධනය මග පාදන සෛලීය ඉන්ද්‍රියිකා නිපදවයි.
- S කලාවට අත්‍යවශ්‍ය වන ප්‍රෝටීන නිපදවේ.

S කලාව

- DNA ප්‍රතිවලිත වේ.
- හිස්ටෝන ප්‍රෝටීන සංශ්ලේෂණය වේ.
- හිස්ටෝන ප්‍රෝටීන මත DNA වෙලී ක්‍රොමැටින් සාදයි.

$G_2$ කලාව

- සෛලීය ඉන්ද්‍රියිකා සහ ප්‍රෝටීන සංශ්ලේෂණය මගින් සෛල වර්ධනය අඛණ්ඩව පවත්වා ගනී.
- අනුනන කලාවට අත්‍යවශ්‍ය ප්‍රෝටීන සංශ්ලේෂණය කරයි.
- කේන්ද්‍ර දේහ ද්විකරණය වේ.

**පිරික්සුම් ස්ථාන :-**

- සෛල විභාජනයේ ඉදිරි කලාවට යාමට සෛල සූදානම් බව සහතික කිරීමට, සෛල චක්‍රය පාලනය කරන පිරික්සුම් ස්ථාන $G_1$ $G_2$ හා M කලාවල ඇත.
- $G_1$ පිරික්සුම් ස්ථානයෙන් සංඥා ලබන සමහර සෛල $G_1$ $G_2$ හා M කලාවන් සම්පූර්ණ කර විභාජනය සම්පූර්ණ කරයි.
- ඉදිරියට යාමට සංඥා නොලද සෛල සෛල චක්‍රයෙන් ඉවත් වී $G_0$ කලාව ලෙස හැඳින්වෙන සෛල විභාජනය නොවන අදිරයට ඇතුළු වේ.

  උදා :- මිනිසාගේ ස්නායු සෛල
  
  මිනිසාගේ පේෂි සෛල

අනුනන කලාව / M කලාව

- සෛල චක්‍රයෙන් 10% පමණ ආවරණය වේ.
- අනුනනය හා සෛල ප්ලාස්ම විභාජනය මෙයට අයත් වේ.

අනුනනය

- එක් මාතෘ න්‍යෂ්ටියකින් ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ න්‍යෂ්ටි 2ක් නිපදවන න්‍යෂ්ටික විභාජනය අනුනනය නම් වේ.
- අධ්‍යනයේදී පහසුව සඳහා අනුනනය අවධි පහකට බෙදයි.

1. ප්‍රාක් කලාව
2. පෙර යෝග කලාව
3. යෝග කලාව
4. වියෝග කලාව
5. අන්ත කලාව

ප්‍රාක් කලාව (Prophas)

- ක්‍රොමැටින් තන්තු  කෙටි වී ඝන වී වර්ණදේහ බවට පරිවර්තනය වේ.
- එවිට ඒවා ආලෝක අන්වීක්ෂයෙන් පෙනේ.
- සෙන්ටොමියරය මගින් සම්බාධ වී ඇති සහෝදර වර්ණදේහාංශ දෙකක් සහිතව වර්ණදේහ දිස්වේ.
- සහෝදර වර්ණ දේහාංශ වල බාහු කොහෙසීන් නැමති විශේෂ ප්‍රෝටීන වලින් බැදි ඇත.
- ක්ෂුද්‍ර නාලිකා දික්වීම හේතුවෙන් කේන්ද්‍ර දේහ සෛලයේ ප්‍රතිවිරුද්ධ ධ්‍රැව දෙසට චලනය වේ.
- අනුනන තර්කුව සෑදීම ආරම්භ වේ.
- තර්කුවට කේන්ද්‍රදේහය, තර්කු ක්ෂුද්‍ර නාලිකා තුරුව ඇතුලත්ය.



පෙර යෝග කලාව - (Prometaphase)



- න්‍යෂ්ටික ආවරණය බිදි යයි.
- වර්ණ දේහ තවදුරටත් ඝන වේ.
- කයිනටොකෝර් නම් විශේෂ ප්‍රෝටීනයක් මගින් වර්ණදේහයේ, වර්ණදේහාංශ වල සෝටොමියරය අසලදී සම්බන්ධ වේ.
- වර්ණදේහයේ කයිනටෝකොර්වලට සම්බන්ධ ක්ෂුද්‍ර නාලිකා, කයිනටෝකෝර් ක්ෂුද්‍ර නාලිකා බවට පත්වන අතර, වර්ණදේහ ඉදිරියට හා පසුපසට චලනය කරවයි.
- කයිනටෝකෝර් වලට සම්බන්ධ නොවන ක්ෂුද්‍ර නාලිකා ප්‍රතිවිරුද්ධ ධ්‍රැවවල සිට එන ක්ෂුද්‍ර නාලික සමග අන්තර් ක්‍රියා කරයි.

**<u>යෝග කලාව : (Metaphase)</u>**

- කේන්ද්‍ර දේහ ප්‍රතිවිරුද්ධ ධ්‍රැව වලට ලඟා වේ.
- එක් එක් ධ්‍රැවයක සිට සමදුරින් පිහිටි "යෝග කලා තලය" වෙත වර්ණ දේහ පැමිණේ.
- සෑම වර්ණදේහයකම සෙන්ට්‍රිමියරය යෝග කලා තලයේ පිහිටයි.
- මේ කලාවේ අවසානයේ, එක් එක් වර්ණ දේහයේ සෙන්ටොමියර අසලදී කයිනර්ටොකොර් ක්ෂුද්‍ර නාලිකාවලට බැදී යෝග කලා තලයේ පෙළ ගැසේ.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

(යෝග කලාව රූප සටහන)

වියෝග කලාව (Anaphase)

**රූප සටහන :-**

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

- සහෝදර වර්ණ දේහාංශ සෙන්ටොමියරයෙන් වෙන් වේ.
- කයිනටොකෝර්වලට සම්බන්ධ ක්ෂුද්‍ර නාලිකා කෙටි වී වර්ණ දේහාංශ ප්‍රතිවිරුද්ධ ධ්‍රැවවලට ඇදේ.
- කයිනටෝකෝර්වලට සම්බන්ධ නොවූ ක්ෂුද්‍ර නාලිකා දිගු වීමෙන් සෛල දිගින් වැඩි වේ.
- අවසානයේ සමාන හා සම්පූර්ණ වර්ණදේහ කට්ටල සෛලයේ එක් එක් ධ්‍රැවයේ පිහිටයි.

**අන්ත කලාව : (Telophase)**

- එක් එක් වර්ණදේහ කට්ටලය වටා න්‍යෂ්ටි ආවරණට සෑදේ.
- න්‍යෂ්ටිකාව නැවත දර්ශනය වේ.
- තර්කු ක්ෂුද්‍ර නාලිකා විබහු අවයකරණය වේ.(depolymerized)
- වර්ණදේහ ලෙහී ඝන වීම අඩු වී ක්‍රොමැටින් සාදයි.
- ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ න්‍යෂ්ටි සාදයි.



අන්ත කලාව හා සෛල ප්ලාස්ම විභාජනය

සෛල ප්ලාස්ම විභාජනය :- (Cytokinesis)

- අන්ත කලාව අවසානයේ සෛල ප්ලාස්ම විභාජනය ඇරඹේ.අවසානයේ ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ සෛල දෙකක් ඇති වේ.

  සත්ව සෛල - භේදන ඇලියක් ඇතිවේ.
  ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ සෛල 2ක් ඇති වේ.

  ශාක සෛල - ගොල්ගි උපකරණය නිපදවන ආශයිකා සෛල තලයක් සාදයි එමගින්
  සෛල ප්ලාස්ම දෙකට බෙදී මාතෘ සෛලයට ප්‍රවේණිකව සර්ව සම දුහිතෘ සෛල යුගලයක් සාදයි.

**අනුනනයේ වැදගත්කම :**

- ප්‍රවේණික ස්ථායිතාව පවත්වාගැනීම.
- වර්ධනය හා විකසනයට.
- සෛල අලුත්වැඩියාව, ප්‍රතිස්ථාපනය හා පුනර්වර්ධනය.
- අලිංගික ප්‍රජනනයට.

**ඌනන විභාජනය -**

- ලිංගික ප්‍රජනනය සිදු කරන ජීවීන් සිදු කරන වෙනස් ආකාරයක සෛල විභාජනයක් ඌනනය ලෙස හඳුන්වයි.
- ද්වි ගුණ මාතෘ න්‍යෂ්ටියකින්, ප්‍රවේණිකව සර්ව සම නොවන ඒකගුණ දුහිතෘ න්‍යෂ්ටි හතරක් සාදයි.
- අනුයාතව සිදුවන න්‍යෂ්ටි විභාජන 2ක් සමන්විතය.
- ඌනනය I හා ඌනනය II ලෙස හඳුන්වයි.
- ඌනනය I වර්ණදේහ සංඛ්‍යාව අඩුවන විභාජනයකි.
- ඌනනය II අනුනනයට සමානය.
- ඌනනයට පෙර අන්තර් කලාවේ ඇති සෛලයක S කලාවේදී DNA ප්‍රතිවලිත වේ.

ඌනනය I

ප්‍රාක් කලාව I

- වර්ණදේහ ඝන බවට පත් වේ.
- න්‍යෂ්ටිකාව අතුරුදහන් වීමට පටන්ගනී.
- විශිෂ්ට ප්‍රෝටීනයක් මගින් සමජාත වර්ණදේහ යුගල තදින් බැද තබන සිප් (Zipper) එකක් වැනි ව්‍යුහයක් සෑදේ.
- එය 'උපාගම පට සංකීර්ණය' නම්වේ.
- සමජාත වර්ණදේහ යුගලනය හා භෞතිකව සම්බන්ධ වීම <u>උපාගමය</u> ලෙස හදුන්වයි.
- උපාගමයේ දී,

  සමජාත වර්ණදේහ යුගලෙහි සහෝදර නොවන වර්ණදේහාංශවල DNA අණුවේ කොටස් කැඩී, හුවමාරු වී, අනුරූපී ලක්ෂවලදී නැවත සම්බන්ධ වේ.මෙම ක්‍රියාවලිය <u>අවතරණය</u> ලෙස හදුන්වයි.
- උපාගම පට සංකීර්ණයෙන් වෙන් වූ පසු අවතරණය වූ ස්ථාන <u>මංසල</u> ලෙස පෙනේ.



සමජාත වර්ණදේහ යුගල

- සමජාත වර්ණ දේහ සුළු වශයෙන් ඇත්වේ.
- න්‍යෂ්ටි ආවරණය බිඳ වැටේ.
- සත්ව සෛල වල තර්කුව සාදමින් කේන්ද්‍ර දේහ ප්‍රතිවිරුද්ධ ධ්‍රැව කරා ගමන් කරයි.
- සමජාත වර්ණදේහවල කයිනටොකෝර්වලට ධ්‍රැව වල සිට එන ක්ෂුද්‍ර නාලිකා සම්බන්ධ වේ.
- සමජාත වර්ණදේහ යුගල යෝග කලා තලය දෙසට ගමන් කරයි.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

යෝග කලාව I

- සමජාත වර්ණදේහ  යුගල යෝග කලා තලයේ සකස් වන්නේ,
- එක් එක් යුගලයේ එක් වර්ණ දේහයක්, එක් එක් ධ්‍රැවයට මුහුණලා පිහිටන පරිදිය.
- එක් සමජාත වර්ණ දේහයක වර්ණදේහාංශ දෙකට එක් ධ්‍රැවයක සිට එන කයිනටොකෝර් ක්ෂුද්‍ර නාලිකාවලට සම්බන්ධවේ.
- සමජාත වර්ණදේහ අහඹු ලෙස යෝග කලා තලය මත සකස් වේ.




- තර්කුවේ කයිනටෝකෝර නාලිකා කෙටි වීම අරඹයි.
- සමජාත වර්ණ දේහය යුගලක් වෙන් වේ.
- එක් වර්ණ දේහයක්, ප්‍රතිවිරුද්ධව ධ්‍රැව දෙසට චලනය වේ.
- එක් එක් වර්ණ දේහයේ සහෝදර වර්ණදේහාංශය සෙන්ටොමියරයට සම්බන්ධ වී පවතින අතර තනි ඒකකයක් සේ ධ්‍රැව දෙසට චලනය වේ.

**රූප සටහන :-**

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

අන්තර් කලාව I

- එක ගුණ වර්ණ දේහ කට්ටලයක් එක් එක් ධ්‍රැවයේ පිහිටයි.
- ඒවා වටා න්‍යෂ්ටි ආවරණය සෑදේ
- න්‍යෂ්ටිකාව යළි දිස්වේ.
- තර්කුව කැඩී බිඳී යයි.
- වර්ණ දේහ ලිහිල් වී ක්‍රොමැටීන් බවට පත් වේ.
- ප්‍රවේණිකව සර්ව සම නොවන ඒකගුණ න්‍යෂ්ටි දෙකක් සෑදේ.

**සෛල ප්ලාස්ම විභාජනය**

- අන්ත කලාව I ට සමගාමීව සිදුවේ.
- එක් ගුණ සර්ව සම නොවන දුහිතෘ සෛල 2 ක් සෑදේ.
- සත්ව සෛල වල භේදන ඇලියක් ද, ශාක සෛල වල සෛල තලයක් ද සකස් වේ.

✷ ඌනනය I හා ඌනනය II අතර DNA ප්‍රතිවලිත වීමක් සිදු නොවේ.

**අන්තර් කලාව I හා සෛල ප්ලාස්මීය**

**විභාජනයඃ- රූප සටහන**

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

<u>ඌනනය II</u>

ඌනනය II යටතේ, ප්‍රාක් කලාව II

යෝග කලාව II , වියෝග කලාව II

අන්තර් කලාව II සෛල ප්ලාස්ම විභාජනය යන අවස්ථා වල සිදුවීම් රූප සටහන් භාවිතා කරමින් පැහැදිලි කරන්න.

<u>ඌනනයේ වැදගත් කම</u>

- ලිංගික ප්‍රජනනය සිදුකරන විශේෂ වල පරම්පරා ඔස්සේ නියත වර්ණ දේහ සංඛ්‍යාවක් පවත්වා ගැනීම.
- පරිනාමයට මග පාදන ප්‍රවේණික ප්‍රභේදන ඇතිවීම.
- අවතරණය,ප්‍රතිසංයෝජනය, හා ස්වාධීන සංරචනය නිසා ප්‍රවේණික ප්‍රභේදන ඇති වීම.

උෟනන විභාජනය හා අනුනන විභාජනය අතර වෙනස්කම් සසඳන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

<u>අර්බුද, පිළිකා, ගඩු</u>

- සෛල චක්‍රය බාහිර හා අභ්‍යන්තර සාධක මගින් මෙහෙය වේ.
- ඒවා රසායනික සාධක හෝ භෞතික සාධක විය හැක.
  රසායනික සාධක - වර්ධක සාධක
  භෞතික සාධක - සණත්වය මත රදා පවතින නිශේධනය
- පිළිකා සෛල දේහයේ පාලන යාන්ත්‍රණ වලට ප්‍රතිචාර නොදක්වයි.
- සෛල චක්‍රය යාමනය කරන සාමාන්‍ය සංඥා,පිළිකා සෛල නොසලකයි.
- ඒවාට වර්ධක සාධක අවශ්‍ය නොවේ.
  ඔවුන්ට අවශ්‍ය වර්ධක සාධක එම සෛල විසින්ම සාදා ගැනීම හෝ වර්ධක සාධක රහිතව සෛල චක්‍රය ඉදිරියට ගෙන යාමට සංඥා ලබා දෙයි.
- අසාමාන්‍ය සෛල චක්‍ර පාලන පද්ධති තිබීම තවත් හැකියාවකි.
- මෙම පිළිකා සෛල අධිකව බෙදී අනෙක් පටක ද ආක්‍රමණය කරයි. මැඩ පැවැත්වීම සිදු නොකළ හොත් ජීවියා මරණයට පත් වේ.
- ගැටලුව ආරම්භ වන්නේ පටකයක ඇති තනි සෛලයක් පරිණාමය වූ විටය. මේ ක්‍රියාවලිය සාමාන්‍ය සෛලයක් අසාමාන්‍ය සෛලයක් බවට පරිවර්තනය කරයි.

✷ දේහයේ ප්‍රතිශක්තිය කරන පද්ධතියට එය හඳුනාගත නොහැකි හා විනාශ කිරීමට නොහැකි නම්, සෛල ගුණනය වීමට හා අර්බුදයක් සෑදීමට මෙය මග පාදයි.

  - නිරුපද්‍ර අර්බුද - අසාමාන්‍ය සෛල මුල් ස්ථානයේ ම රැදීමෙන් ඇති වන ඉදිමුම නිරුපද්‍ර අර්බුදයකි.
  - බොහෝ ඒවා අනතුරු දායක නොවන අතර ශල්‍ය කර්මයකින් ඉවත්කළ හැකිය.

- සෝපද්‍රව අර්බුද ආක්‍රමණශීලී වී අවයව ඒකකට හෝ කීපයකට පහර දේ.
  සෝපද්‍රව අර්බුදයක් ඇති අයෙකුට පිළිකාවක් ඇතියි කියනු ලැබේ.

- මුල් අර්බුදයෙන්, සෛල ස්වල්පයක් වෙන් වී රුධිර වාහිනි හෝ වසා වාහිනී තුලට ඇතුළු වී දේහයේ අනෙකුත් කොටස් වලට ඇතුළු විය හැකිය ඒවා ගුණනය වී නව අර්බුද ඇති කරයි.
- මුල් ස්ථානයේ සිට ඊට දුරින් පිහිටි ස්ථානයට පිළිකා සෛල පැතිරීම " ස්ථානාන්තරණය"ලෙස හදුන්වයි.

<u>ශාකවල ඇති ගඩු</u>

- ශාක සෛල වල පාලනය කල නොහැකි අනුනන විභාජනය නිසා ඇති වේ.
- ශාක සෛල විභාජනය පාලනය කරන ඔක්සීන හා සයිටොකයිනින් වැනි ශාක වර්ධක යාමක අතර තුලිතතාවය නැති වු විට, විභේදනය නොවු සෛල ස්කන්ධයක් නිපදවයි.
- ගඩු යනු ඉදිමුමක් හා වර්ධනයක් වන අතර ඇතැම් සුවිශේෂී ජීවීන් ආක්‍රමණය කිරීමෙන් පසු ශාක වල විවිධ කොටස් මත විකසනය වේ.
- ගඩු වලට හේතු රාශියකී.
    - ♦ වෛරස, දිලීර, බැක්ටීරියා
    - ♦ කෘමීන් හා මයිටාවන්
- ඉහත ගඩු කාරක යම් ආකාරයකට ශාකයක වර්ධක පටක ආක්‍රමණය හෝ විනිවිද යාම, ධාරකයාට තම සෛල ප්‍රතිසංවිධානය කර අසාමාන්‍ය වර්ධනයක් ඇති කිරීමට හේතු වේ.

## <u>2.4.1 පරිවෘත්තීය ක්‍රියාවලිවල ශක්ති සම්බාධතා</u>

පරිවෘත්තීය ක්‍රියා

| සංවෘත්තීය ප්‍රතික්‍රියා | අපවෘත්තීය ප්‍රතික්‍රියා |
|---|---|
| ○ නිදහස් ශක්ති අවශෝෂණය කරමින්<br>○ සරල අණු වලින් සංකීර්ණ අණු සෑදීම.<br>○ ශක්ති අවශෝෂක ක්‍රියාවලියකි. | ○ සංකීර්ණ අණු සරල අණු බවට බිද හෙළමින්<br>○ නිදහස් ශක්ති මුදා හරියි.<br>○ ශක්ති දායක ප්‍රතික්‍රියා වේ. |

- බැක්ටීරියා ඇතුළු සියලු ජීවීන්ගේ ශක්ති වාහකයා ATP වේ.
- ශක්ති හුවමාරු ක්‍රියාවලියේ සාර්වත්‍ර විනිමය ATP වේ.
- ජීවිහු ජෛව ක්‍රියාවලි සඳහා ශක්තිය භාවිත කරයි.

    උදා :- ද්‍රව්‍ය සංශ්ලේෂණය

ජෛව ගෝලය තුළ ජීවී පද්ධති වල ශක්ති සම්බන්ධතා :-

(1) **පියවර** :- සූර්ය විකිරණ මගින් පරිසරයේ සිට ශක්තිය ජෛව පද්ධති තුළට ගමන් කිරිම.

(2) **පියවර** :- ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය මගින් ආලෝක ශක්තිය, කාබෝහයිඩ්‍රේට වැනි කාබනික සංයෝගවල රසායනික ශක්තිය ලෙස ගබඩා කිරීම.

(3) **පියවර** :- සෛලීය ස්වශනයේදී එම ශක්තිය, ATP තුළ රසායනික ශක්තිය බවට පරිවර්තනය.

(4) පියවර :- ATP වල ගබඩා වී ඇති ශක්තිය, විවිධ ශක්ති අවශ්‍යතා සඳහා යොදා ගැනීම.

**ATP - ඇඩිනොසින් ට්‍රයි පොස්පේට්**

- ATP නියුක්ලියෝටයිඩයකි.

එහි - රයිබෝස් - සිනි
ඇඩිනීන් - නයිට්‍රජනීය භාෂ්ම
පොස්පේට් කාණ්ඩ 3 ක දාමයන් ඇත.

රූප සටහන් :-

ATP අණුවේ ව්‍යුහය

- ATP අණුව සචලය
- එම නිසා සෛල තුළ ඕනෑම ශක්ති අවශ්‍ය ස්ථානයකට ශක්තිය රැගෙන යාමට හැකිය.

- බොහෝ ජෛව ප්‍රතික්‍රියා අග්‍රස්ථ පොස්පේට් බන්ධනය බිදෙන විට පිට වන ශක්තිය භාවිත කරයි.
- ATP ජල විච්ඡේදනයේ දී සෑම පොස්පේට් කාණ්ඩයක් සඳහාම ලබා දෙන නිදහස් ශක්තිය - **30.5 KJ/mol** වේ.
- ADP, අකාබනික පොස්පේට් හා ශක්තිය භාවිතා කර, සෛල තුළ කෙටි කලකදී ATP නිපදවිය හැකිය.
- සෛල තුළ ATP නිපදවීම **"පොස්ෆොරයිලිකරණය"** ලෙස හඳුන්වයි.
- ශක්ති ප්‍රභවය අනුව පොස්ෆොරයිලිකරණය ආකාර 03 කී.
    - **ප්‍රභාපොස්ෆොරයිලිකරණය** - ප්‍රභාසංශ්ලේෂණයේදී සූර්ය ශක්තිය භාවිතයෙන් ATP සංශ්ලේෂණය
    - **උපස්තර පොස්ෆොරයිලිකරණය** - සංකීර්ණ අණු සරල අණු බවට බිද හෙළීමේදි නිදහස් වන ශක්තිය භාවිතයෙන් ATP නිපදවීම.
    - **ඔක්සිකාරක පොස්ෆොරයිලිකරණය** - අණු ඔක්සිකරණයෙන් නිදහස් වන ශක්තියෙන් ATP නිපදවීම.

ATP වල අඩංගු ශක්තිය, විවිධ කාර්ය ඉටුකර ගැනීමට විවිධ ශක්ති ආකාර වලට පරිණාමනය වේ.




සැකසුම :- ඉමල්කා හල්ලොලුව
රාජසිංහ මධ්‍ය විද්‍යාලය, රුවන්වැල්ල.